
| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020<br>උපකාරක ප්‍රශ්න පත්‍රය | | | |
| ශ්‍රේණිය 11 | විෂය : චිත්‍ර කලාව | පත්‍රය: I | කාලය: පැය 01 යි |

## I කොටස

සැලකිය යුතුය.

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න වල හිස්තැන් පුරවන්න.



(01) මෙම රූපයෙන් දැක්වෙන වටදාගෙය අයත් වන්නේ ........................................................ යුගයට ය.

(02) මෙම වාස්තු විද්‍යා නිර්මාණය කරවූවා යැයි සැලකෙන්නේ ........................................ රජතුමාට ය.

(03) මෙහි ඇතුළු මලුව වටා ඇති ගල් බැම්මෙහි අලංකාර ලෙස ........................................................ හැඩයෙන් රටාවක් ලෙස යෙදූ කැටයමක් දක්නට ලැබේ.

(04) මෙම වටදාගෙයි උතුරු දොරටුවේ ඇති ............................................... කැටයම් පුවරුව මෙම යුගයේ ඉදි වූ කලාත්මකම නිර්මාණයයි.

(05) චෛත්‍යයෙහි සතර පැත්තේ සතර දිශාවට මුහුණලා ................................................... මුද්‍රාවෙන් වැඩ සිටින බුදු පිළිම හතරකි.

- අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

(06) යමක් අල්ලා ගෙන සිටින ආකාරය නිරූපණය වන මුද්‍රාව කුමන නමකින් හැඳින්වේ ද?

-----------------------------------------------------------------------------------

(07) පාරම්පරික පිත්තල කර්මාන්තයේ දී භාවිත වන ප්‍රධාන වාත්තු ක්‍රම දෙක හඳුන්වන්න.

-----------------------------------------------------------------------------------

(08) ඇතා සහ ඇත් පැටවා නම් වූ ප්‍රාග් ඓතිහාසික සිතුවම හමුවන ස්ථානය නම් කරන්න.

-----------------------------------------------------------------------------------

(09) අගස්තියර් හා විනායගර් නමින් පෙරියතම්බි සුබ්‍රමණියම් ශිල්පියා විසින් අඳින ලද සිතුවම දක්නට ලැබෙන්නේ කොහේ ද?

-----------------------------------------------------------------------------------

(10) වාස්තු විද්‍යාත්මක අවකාශය හා රේඛීය පර්යාලෝක ලක්ෂණ හොඳින් දක්නට ලැබෙන ඩාවින්චි ශිල්පියා විසින් නිම කළ අගනා සිතුවම කුමක් ද?

-----------------------------------------------------------------------------------

- අංක 11 - 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

(11) අභයගිරි චෛත්‍ය ඓතිහාසික වශයෙන් වඩාත් වැදගත් වන්නේ,

i. අනුරාධපුර යුගයේ ඉදි වූ සුවිසල් චෛත්‍ය තුනෙන් එකක් වීම.
ii. අටමස්ථානය නියෝජනය කරන සුවිසල් චෛත්‍ය නිසා ය.
iii. ගිරි නිඝන්ඨයාගේ ආරාමය තිබූ තැන වට්ටගාමිණී අභය රජතුමා මෙය ඉදිකර වූ නිසා ය.
iv. මුරගලේ විකාශනයේ දී හමුවන සංඛ නිධි හා පද්ම නිධි මුරගල් දක්නට ලැබෙන නිසා ය.

(12) අනුරාධපුර යුගයේ විශිෂ්ට හිටි බුද්ධ ප්‍රතිමාවක් වූ අවුකන බුදු පිළිමයෙන්,

i. අමරාවතී කලා ලක්ෂණ පෙන්වයි. ii. පල්ලව කලා ලක්ෂණ පෙන්වයි.
iii. ගුප්ත කලා ලක්ෂණ පෙන්වයි. iv. මථුරා කලා ලක්ෂණ පෙන්වයි.

(13) ශාස්ත්‍රාලීය යථාර්ථවාදී චිත්‍ර කලාවේ ආභාෂය සහිතව මුදළිඳු අමරසේකර මහතා විසින් ඇඳි සිතුවමක් නොවන්නේ,

i. රිඩී මාවත ii. පූස් පැටවා
iii. රාජ්‍ය නායකයන්ගේ ආලේඛ්‍ය චිත්‍ර iv. ඇසල පෙරහැර


(14) මහනුවර යුගයේ සිතුවම් හමුවන දෙගල්දොරුවේ ඇති සුවිශේෂී සමාජ ප්‍රකාශනයක් නිරූපණය වන සිතුවම,

i. මිහිකත දක්වෙන සිතුවමයි. ii. මාර පරාජය සිතුවමයි.
iii. ඇලි ඇතා දන් දීම සිතුවමයි. iv. වෙස්සන්තර ජාතකය සිතුවමයි.


(15) ස්වභාවික ස්වරූපයට වෙනස් වූ ශෛලීගත බවකින් නිරූපණය කර ඇති ඉන්දු නිම්න ශිෂ්ටාචාරය අයත් උඩුකය මූර්තිය

i. රතු වැලි ගලින් නෙළන ලද කවන්ධ මිනිස් රුවයි.
ii. සුදු හුණු ගලින් නෙළන ලද පූජකයාගේ රුවයි.
iii. අළු වැලි ගලින් නෙළන ලද කවන්ධ රුවයි.
iv. ලෝකඩ මාධ්‍යයෙන් නිම කළ නළඟන රුවයි.

- ප්‍රශ්න අංක 6 - 20 තෙක් දී ඇති රූප සටහන් කොටස්වලට සෘජු සබඳතාවයක් දක්වෙන රූප සටහන, ඉදිරියෙන් ඇති A,B,C,D,E යන රූප සටහන් අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න

(16)  (.....................)  A

(17)  (.....................)  B

(18)  (.....................)  C

(19)  (.....................)  D

(20)  (.....................)  E

- අංක 21 සිට 25 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.

(21) වයනය - ..........................................................................................

(22) වීරාසන - ..........................................................................................

(23) වෙරාකොටා - ..........................................................................................

(24) ගෝපුරම් - ..........................................................................................

(25) අල්ලියාදු - ..........................................................................................

- අංක 26 - 30 තෙක් දී ඇති එක් එක් වැකිවල හිස්තැනට සුදුසු වචනය / වචන යොදා සම්පූර්ණ කරන්න.

(26) ග්‍රීක දාර්ශනිකයින් රැසකගේ ක්‍රියාකාරී ඉරියව් වාස්තු විද්‍යාත්මක පසුතලයක් තුල සංරචනය වූ රෆායෙල්ගේ සිතුවම ........................................................................... නම් වේ.

(27) දකුණු ඉන්දීය තන්ජාවූර් ශිල්ප ක්‍රමය භාවිත කරමින් සුදු කුකුළා නම් වූ සිතුවම නිම කළේ ........................................................................... විසිනි.

(28) කිතුනු තේමා චිත්‍රණය කිරීමේ දී යුරෝපීය සංස්කෘතිය හා භූ තලය වෙනුවට ශ්‍රී ලාංකික සමාජ පසුබිමක යහපත් සමරිතානුවා නම් වූ සිතුවම නිම කළේ ........................................................................ ය.


(29) අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතු කිරීම ........................................................................... නමින් හැඳින්වේ.

(30) මහියංගනං, නාගදීපං, කල්‍යාණං, පද ලාංඡනං, ලෙස බුදුන්ගේ ලංකාගමනයේ ප්‍රධාන අවස්ථා දැක්වෙන කැලණි නව විහාරයේ සිතුවම් හතර ........................................................ ශිල්පියා අතින් නිම විය.

- අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්න වලට F, G, H, I, J යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.



F




G



H



I



J

31. F අක්ෂරයෙන් දැක්වෙන ජෝර්ජ් කීට් ශිල්පියාගේ මෙ සිතුවම වඩාත් ප්‍රචලිත වී ඇත්තේ. ................ . ........................................................................ චිත්‍ර නමිනි.

32. G අක්ෂරයෙන් දැක්වෙන්නේ 'වඩම්' නම් කඹ විශේෂය යොදා ඇදගෙන යන ........................................ ........................................................................ හින්දු කෝවිල් ආශ්‍රිත මැරම් වාහනම් විශේෂයයි.

33. H අක්ෂරයෙන් දැක්වෙන්නේ ශිව දෙවියන්ගේ වේෂයක් ලෙස ජෝන් මාෂල් හඳුන්වන .................. ........................................................ ඵලකය ඉන්දුනිම්නයෙන් හමු වූ මුද්‍රාවකි.

(34) I අක්ෂරයෙන් දැක්වෙන්නේ භාවිය ගුණයෙන් අනූන කිරි ගරුඬ මාධ්‍යයෙන් නිම කළ අඩි 14 ක් උස මෙම නග්න ප්‍රතිමාව ............................................... නමින් හැඳින්වේ.

(35) J අක්ෂරයෙන් දැක්වෙන්නේ 2011 දී එකලස් කිරීමේ ශිල්ප ක්‍රමයට එච්.ඒ.කරුණාරත්න ශිල්පියාගේ ................................................. නම් වූ කලා කෘතියයි.

- පහත දැක්වෙන කලා කෘතිය හඳුනාගෙන එහි කලාත්මක ලක්ෂණ දී ඇති උප මාතෘකාවලට අදාළවන සේ අර්ථවත් වාක්‍ය 5 ක් ලියන්න.



36. හඳුනාගත් බව :

..............................................................................................................................

..............................................................................................................................

37. සම්පිණ්ඩනය

..............................................................................................................................

..............................................................................................................................

38. මාධ්‍ය භාවිතය

..............................................................................................................................

..............................................................................................................................

39. ශිල්පීය කුසලතාවය

..............................................................................................................................

..............................................................................................................................

40. කලා ලක්ෂණ

..............................................................................................................................

..............................................................................................................................

ලකුණු 40

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2019<br>උපකාරක ප්‍රශ්න පත්‍රය | | | |
| ශ්‍රේණිය 11 | විෂය : චිත්‍ර කලාව | පත්‍රය: II | කාලය: පැය 02 යි |

**නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය.**

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට,
  1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබ සපයාගත් රළු කඩදාසිය භාවිත කරන්න.
  2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න. මේ සඳහා ඔබ යොදා ගන්නා වර්ණ මාධ්‍යයට සුදුසු කඩදාසියක් භාවිත කරන්න.

- මෙම චිත්‍ර දෙකම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

**රේඛා අධ්‍යයනය**

1. රළු කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා

**වර්ණ චිත්‍රය**

2. ද්‍රවය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම
3. පරිමාණය, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාවය
6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව


**සැලකිය යුතුයි**

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහය ට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

ලකුණු 30

## ශාලාධිපති උපදෙස්

අවශ්‍ය ද්‍රව්‍ය :
1. වර්ණවත් කොළ පහක් හෝ හයක් සහිත සෙ.මී. 30 ත් පමණ වූ කොළ අත්තක්
2. සෙ.මී. 12 ක් පමණ උස අඩුව සහිත ප්ලාස්ටික් කෝප්පයක්
3. එක වර්ණයක රෙදි කැබැල්ලක්
4. සෙ.මී. 32 X 22 X 14 ප්‍රමාණයේ ඝනකයක් (පෙට්ටියක්)
5. ප්ලාස්ටික් බෝලයක්
6. දොඩම් ගෙඩියක්, අඹ ගෙඩියක් හෝ ඇපල් ගෙඩියක්
7. ආධාරකයක් - (Drawing Board)




**සැලකිය යුතුයි.**

- ද්‍රව්‍ය සැලසුමේ සිට මීටර් 2.5 ක් දුරින් සිටින සේ අර්ධ කවාකාරව සිටින සේ ආසන 15 කට නොවැඩිව ශාලාව සකස් කළ යුතුය.
- දී ඇති සැලැස්මට අනුව නිවැරදිව ද්‍රව්‍ය සමූහය ඇස් මට්ටමෙන් පහළට සිටින සේ සකස් කළ යුතුය.
- කොළ අත්ත මැළැවීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
- විභාගය අවසානයේ දී රේඛා අධ්‍යයනයත්, වර්ණ චිත්‍රයත් එකට අමුණා භාර ගත යුතුය.
- ද්‍රව්‍ය සමූහය සකස් කිරීමට චිත්‍ර විෂය භාර ගුරුභවතාගේ සහය ලබා ගත යුතුය.

ලකුණු 30

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020<br>උපකාරක ප්‍රශ්න පත්‍රය | | | |
| ශ්‍රේණිය 11 | විෂය : චිත්‍ර කලාව | පත්‍රය: III | කාලය: පැය 02 යි |

**සැලකිය යුතුය.**

- ඔබේ විභාග අංකය/නම හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලිව ලියන්න.
- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණයි.
- උත්තර පත්‍රය භාර දෙන විට එය හොඳින් වියළී තිබිය යුතුය.
- චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැක.
- දිය සායම් පෝස්ටර් සායම් පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිතා කළ හැක.

- **'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරා ගන්න.**

**'අ' කොටස - චිත්‍ර සංරචනය**

1. ගම්බද කඩයක් හෝ පදික වේදිකාවේ පවත්නා ගෙන යන පෙට්ටි කඩයක්
2. චන්දනා නඩයක් එළිමහනේ තුරු සෙවනක දිවා ආහාරය ගන්නා අවස්ථාවක්
3. පහත දැක්වෙන කවිය චිත්‍රයට නගන්න.

ලීලයි කමලයි චම්පයි රේඛා යි
භානුමතී නයනායි සඳලේඛා යි
දිය ගෙන යාමට එන ළිඳ මේක යි
මේ ළිඳ ළඟ නිතරම අවිවේක යි

4. නිවාසාන්තර ක්‍රීඩා උත්සවයක තම නිවාසයේ ජයග්‍රහණය වෙනුවෙන් ප්‍රීති ඝෝෂා කරන ළමයි.

**'ආ' - කොටස - මෝස්තර නිර්මාණය**

5. සාම්ප්‍රදායික මෝස්තර ඇසුරු කරගෙන ඕවලාකාර හැඩයෙන් යුත් පිත්තල බන්දේසියකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.
6. ව්‍යාප්ත කළ හැකි වන පරිදි මුද්‍රණය කිරීම සඳහා 9" x 9" ප්‍රමාණයේ චිත්ත මෝස්තරයක් පස්පෙති මල් හා කොළ ඇසුරෙන් නිර්මාණය කරන්න.
7. සරමක වාටිය සැරසීම සඳහා බතික් ක්‍රමයට වර්ණ ගැන්විය හැකි වාටි මෝස්තරයක් සත්ත්ව හැඩතල ඇසුරෙන් නිර්මාණය කරන්න.

**'ඉ' - කොටස - ග්‍රැෆික් චිත්‍ර**

8. අඟල් 1 x 2 x 3 ප්‍රමාණයේ සබන් කැටයක් සඳහා දවටනයක් සැලසුම් කරන්න. සබන් වර්ගයේ නම හා අවශ්‍ය වන යෙදුම් ඔබ නිර්මාණය කරගන්න.
9. "ළමා පරපුර දූයේ සම්පතයි" මැයෙන් විචිත්‍රවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
10. පාසලේ වාර්ෂික චිත්‍ර ප්‍රදර්ශනය සඳහා විචිත්‍රවත් ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.

ලකුණු 30

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020<br>උපකාරක උපදෙස් පත්‍රය | | | |
| ශ්‍රේණිය 11 | විෂය : චිත්‍ර කලාව | පත්‍රය: II | කාලය: පැය 02 යි |


නිපුණතාව 2.0 : පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මක චිත්‍රණය කරයි.


ක්‍රියාකාරකම 2.1.1. : ද්‍රව්‍ය සම්පිණ්ඩන රේඛාවෙන් අධ්‍යයනය කරයි.


<u>**ද්‍රව්‍ය බලා ඇඳීමේදී දරුවන් සංවර්ධනය කිරීමට ගුරුභවතුන් සඳහා කරන මගපෙන්වීම.**</u>


- පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලියේ දී ඔබ ක්‍රියාත්මක විය යුත්තේ කෙසේ ද?
- ඔබගේ පන්තිකාමර ඉගැන්වීම් ක්‍රියාවලිය නිරීක්ෂණයේ දී
  1. ඝනකය දරුවන්ගේ අභ්‍යාස වල එකම ආකාරයකට දිස් වෙන අවස්ථා නිරීක්ෂණය වේ.
  2. ඝනකයක් ඇඳීමේදී පිළිපැදිය යුතු සිද්ධාන්ත දිගින් දිගටම වැරදි ලෙස ක්‍රියාත්මක වීම නිරීක්ෂණය වේ.
  3. a. මේ සඳහා ඔබේ මැදිහත්වීම සිදු කරන්නේ කෙසේ ද?
     - පන්ති කාමරය තුළ විවිධ ප්‍රමාණයේ ඝනක කිහිපයක් සකස් කර ගන්න. ඒවා වෙනස් කරමින් ද්‍රව්‍ය සමූහය සඳහා භාවිතා කළ යුතු අතර දරුවන් සිටින ස්ථාන ද නිරන්තරයෙන් මාරු කරන්න.
     - ගුරු මාර්ගෝපදේශයෙහි ඒ ඒ ක්‍රියාකාරකම සඳහා යෝජිත උපකරණ එකම ඒවා තැබීමෙන් වලකින්න. විවිධතාවයක් ඇති කිරීමට කටයුතු කරන්න.
     - යෝජිත සෑම උපකරණයක් ම ඇඳීමේදී විෂය අන්තර්ගතය පිළිබඳ දරුවන්ට නිවැරදි වැටහීමක් ලබා දෙන්න. (පරිමාණය හා පරිමාව, පර්යාලෝකය, ඇස්මට්ටම, එළිය අඳුර, පිහිටීම, ත්‍රිමාණ ලක්ෂණ)

***ඝනකයක් ඇඳීමේදී පහත දැක්වෙන ආදර්ශන වල ඇති සිද්ධාන්ත පිළිබඳව දරුවන්ගේ අවධානය යොමු කරවන්න. අභ්‍යාස වැඩි වශයෙන් කරවන්න.***












ඉහත සිද්ධාන්තවලට අනුව නිදහස් අතින් සනක විවිධ ඇස් මට්ටම් වලට අනුව වේගයෙන් ඇඳීමට දරුවන් යොමු කරවන්න.

කළ ගෙඩියක් රේඛාවෙන් අඳිමු. පියවර අනුගමනය කරමු.





- ද්‍රව්‍යය හොඳින් නිරීක්ෂණය කරවීමෙන් හැඩතල, ගති ස්වභාවය, පරිමාණය, පරිමාව දැසින් කියවීමට දරුවන්ට මග පෙන්වන්න.

- සරල ජ්‍යාමිතික හැඩතල භාවිතයේ සිට සංකීර්ණ හැඩතලය දක්වා රැගෙන එන හැටි කියා දෙන්න.




- එළිය අඳුර නිසා ද්‍රව්‍යයක ඇති වන ත්‍රිමාණ හැඩය හා ගති ස්වභාවය හඳුනා ගැනීමට දරුවන්ට උදව් කරන්න.




- නිරන්තරයෙන් දරුවන් සමග ගැටෙමින් අගය කරන්න. උපස්තම්භනය කරන්න. අවශ්‍ය මැදිහත්වීම් කරන්න.



දුන් ද්‍රව්‍ය කීපයක් එකලස් කොට රේඛාවෙන් අඳිමු. (පෙට්ටිය මත තැබූ බෝලයක්, ක්‍රෝටන් අත්තක් සහිත ප්ලාස්ටික් කෝප්පයක්, පීරිසියක් මත තැබූ පලතුරු ගෙඩි කීපයක් ආදී වශයෙන්)

3. රේඛාවෙන් අධ්‍යයනය කිරීමේ දී දරුවන් තුළ ගොඩනැගිය යුතු ඉගෙනුම් ඵල මොනවාද?
   - දරුවා ද්‍රව්‍යවල හැඩයන් හා ගති ලක්ෂණ නිදහස්ව හා වේගයෙන් රේඛාවෙන් අධ්‍යයනය කිරීමට හැකිය.
   - චිත්‍රමය සිද්ධාන්ත වලට අනුගතව හැඩතල ක්ෂණිකව හඳුනා ගැනීමට හා ප්‍රකාශනය කිරීමට හැකි ය.
   - විවිධ ප්‍රමාණයේ මිනිරන් බර තැබූ පැන්සල් (2B, 4B, 6B, 9B, 10B, 12B) අවශ්‍ය තැනේදී භාවිතා කරයි.
   - රේඛාවේ විවිධතා සාධනය කර ගනිමින් තම අධ්‍යයනය තුළ අපූර්වත්වයක් ගොඩනගයි.
   - වේගවත්ව යමක හැඩතල ග්‍රහණය කර ගනියි. නිවැරදිව දළ සටහන් රේඛාවෙන් අඳියි.

- ඉහත කී උපදෙස්වලට අනුව 11 විෂය නිර්දේශයේ 2.2.4 ක්‍රියාකාරකමට අදාළ ද්‍රව්‍ය ඇටවුම රේඛාවෙන් අඳිමු.

  පියවර 1

  සම්පිණ්ඩනයට අදාළ ද්‍රව්‍ය වෙන් වෙන් ව රේඛාවෙන් අධ්‍යයනය කිරීම.

  පියවර 2

  ද්‍රව්‍ය සම්පිණ්ඩනයට අදාළ උපකරණ තලයක් මත සම්පිණ්ඩනය කොට අඳිමු. එසේ ඇඳීමේදී
  - තලය අර්ථවත්ව භාවිතා කරයි.
  - පරිමාණය හා පරිමාව නිවැරදිව යොදමින් ඒ ඒ ද්‍රව්‍යයන්ගේ ස්වභාවය පෙන්වයි.
  - සිද්ධාන්ත නිවැරදිව භාවිතා කරයි. (පර්යාවලෝකය, අවකාශ භාවිතය (ගැඹුර) ඇස් මට්ටම)

පැවරුම්: ඉහත සැලසුමට අනුගතව 11 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශයේ 2.2 ට අදාළ ඉතිරි ක්‍රියාකාරකම් හතර රේඛාවෙන් අධ්‍යයනය කරන්න.

**<u>අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සම්බන්ධව විෂයානුබද්ධ වූ ද්‍රව්‍ය සම්පිණ්ඩනයක් ඇඳ වර්ණ කරමු.</u>**

ද්‍රව්‍ය කට්ටලය අදාල කරගන්නා උපකරණ ලැයිස්තුව

1. ධාරකයක් (Drawing board)
2. සණකයක්
3. ප්ලාස්ටික් අඩුව සහිත කෝප්පයක දැමූ ක්‍රෝටන් අත්තක්
4. වර්ණවත් රෙදි කඩක්
5. තැඹිලි ගෙඩියක්

වර්ණ මාධ්‍ය - පැස්ටල්

- පළමුව ද්‍රව්‍ය සම්පිණ්ඩනය නිදහස් රේඛාවෙන් වේගවත් අධ්‍යයනයක යෙදෙමු.
- රේඛාවෙන් අධ්‍යයනය කිරීමේ දී ඔබ කළ යුත්තේ ද්‍රව්‍ය සමූහය පිළිබඳව මූලිකව අධ්‍යයනයක යෙදීමයි.
- මෙහිදී වැඩි මිනිරන් බරක් සහිත පැන්සල් භාවිතය ඔබගේ රේඛාවේ වේගවත් හැසිරීමට මහත් රුකුලක් සපයයි.
- සමස්ත ද්‍රව්‍ය කට්ටලය එකක් සේ සලකා අධ්‍යයනය කරනවාට වඩා ඇටවුමේ ඇති ද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් ගෙන අඳින කඩදාසිය මත වෙන වෙනම අධ්‍යයනය කිරීම වඩාත් ප්‍රතිඵලදායක ය.
- මෙහිදී රේඛාවේ සජීවී බව වේගවත් බව රිද්මය හැසිරවීමේ කුසලතාවය ක්ෂණිකව ග්‍රහණය කර ගැනීමේ කුසලතාවය උසස් තත්වයක තිබිය යුතුය.
- දළ සටහන සඳහා ඔබ යොදා ගන්නා ආකෘතිය ජ්‍යාමිතික සටහන් එලෙසම නොමකා තැබීමෙන් ඔබ ඒ ඒ ද්‍රව්‍යයේ හැඩතලය ගොඩනගා ගැනීමට ගත් උපක්‍රම නිරීක්ෂණය වේ. එය ඔබට වාසිදායක ය.

**යෝජිත ද්‍රව්‍ය සම්පිණ්ඩයනයේ දළ රේඛා සටහන සම්බන්ධයෙන් ආදර්ශයක් පහතින් දැක්වේ.**



<u>**ක්‍රියාකාරකමට අදාළ ද්‍රව්‍ය සම්පිණ්ඩනය වර්ණ කරමු.**</u>

මුලින් ම කරන ලද රේඛා චිත්‍රය වර්ණ කිරීමට යොදා ගත නොහැකි ය. එයට හේතුව වන්නේ වේගවත් එක් එක් ප්‍රමාණයේ විවිධ ප්‍රමාණයේ විවිධ මිනිරන් ඝණත්වක් සහිත රේඛා සමූහයක් එහි අන්තර්ගතව ඇති නිසා ය. හේතුව ඔබ වර්ණ කරන ශිල්ප ක්‍රමය අනුව ඇතැම්විට පැන්සල් රේඛා තදට පෙනීමට ඉඩ ඇත. තවද වර්ණ මාධ්‍ය අනුව මිණිරන් ද එම වර්ණයට එකතු වී ඔබ අපේක්ෂා කරන වර්ණය නොලැබීමද සිදු විය හැක.

ක්‍රියාකාරකමට අදාළ ද්‍රව්‍ය සමූහය පැන්සලෙන් ලිහිල් ව, චිත්‍ර ඇඳීමට ගන්නා තලය (කඩදාසිය) තුළ සම්පිණ්ඩනය කර ගන්න.

සම්පිණ්ඩනයේ දී ධරකය මත ද්‍රව්‍ය තබා ඇති ආකාරය හොඳින් නිරීක්ෂණය කළ යුතුය.

ධරකයේ මතුපිට ඇති අවකාශය ද්‍රව්‍ය විසින් ආවරණය වී ඇති අයුරු පිළිබඳව අවධානය යොමු කළ යුතුයි. එය ඔබට පෙර තලය, මැද තලය, පසු තලය ගලපා ගැනීමට පහසු වනු ඇත. (අවකාශ භාවිතය)

ඔබ පැන්සල ලිහිල් කොට ඇඳගන්නා ලද රේඛා සටහන නිරීක්ෂණය කරන්න.
එහිදී

1. තලය නිවැරදිව ඔබ යොදා ගත්තා ද
2. පරිමාව හා පරිමාණය නිවැරදි ද (පරිමාව යනු ඒ ඒ ද්‍රව්‍ය ලබා ගෙන ඇති ඉඩ ප්‍රමාණය වන අතර පරිමාණය යනු, ද්‍රව්‍ය කට්ටලයේ ඇති භාණ්ඩ අතර ඇති සාපේක්ෂ ප්‍රමාණයන් පිළිබඳ දැනුමයි.)
3. පර්යාලෝකය, ඇස් මට්ටම, ඒ ඒ ද්‍රව්‍යයන්ගේ ස්වභාවය නිවැරදිව සංරචනය වූවාද


මේ කරුණු හොඳින් සිදුවූවා නම් වර්ණ කිරීම ආරම්භ කරන්න.



## වර්ණ ගැන්වීම

1. තෝරාගන්නා ලද වර්ණ මාධ්‍යයේ ආවේනික ස්වභාවය හා භාවිතා කරනු ලබන ආකාරය පිළිබඳව අවධානය යොමු කරන්න.
2. මාධ්‍යයට ගැළපෙන ශිල්ප ක්‍රම පිළිබඳව අවධානය යොමු කරන්න.
3. ඒ ඒ ද්‍රව්‍ය වල ගති ස්වභාවය හා මතුපිට ස්වභාවය රැකෙන පරිදි වර්ණ ගැන්වීම කිරීමට, පදනම් වර්ණයේ සිට පියවරෙන් පියවර ඉදිරියට වර්ණ කිරීම කරන්න.

- පැස්ටල් මාධ්‍යයේ දී තද වර්ණයේ සිට ලා වර්ණයට වර්ණ විතැන්ියා* කිරීමට හැකි වුවත් සාමාන්‍ය පෙළ දරුවන්ට ලා වර්ණයේ සිට තද වර්ණය දක්වා වර්ණ සමායෝජනය හා විතැන් කිරීම වඩාත් පහසුවෙන් අවබෝධ කර ගත හැකි ය.





ද්‍රව්‍ය සමූහයට ආලෝකය පතිත වන අයුරු නිරීක්ෂණය කරමින් එළිය අඳුර යොදමින් ත්‍රිමාණ ලක්ෂණ ගොඩ නගන්න.

බොහෝ විට ඔබ චිත්‍රයට නගන ද්‍රව්‍ය සම්පිණ්ඩනය රේඛාවෙන් ඇද ගත්තාට පසු වර්ණ ගැන්වීමේ දී ද්‍රව්‍ය කට්ටලය නිරීක්ෂණය කිරීම ඉතා වැදගත් ය. එයට හේතුව ද්‍රව්‍ය කට්ටලය වෙත පතිත වන ආලෝකය නිසා ජනිත වන උච්ච ආලෝකය මද අඳුර, තද අඳුර හා හෙවනැල්ල ඔබ දකින්නේ එම නිරීක්ෂණයේ දී ය.

වර්ණ කිරීමේ දී මාධ්‍ය හැසිරවිය යුත්තේ ඒ ඒ ද්‍රව්‍යයේ හැඩය, ගුණය පැහැය, ගතිය රැකෙන පරිදි මතුපිට ස්වභාවය (වයනය texture) රැකෙන පරිද්දෙන් ය.

මාධ්‍ය භාවිතයේ දී ඉදිරියෙන් ඇති භාණ්ඩය, පිටුපස ඇති භාණ්ඩයෙන් මතුකර ගැනීමට ඔබ උපක්‍රමශීලී විය යුතුය. ඒ සඳහා යොදා ගන්නා වර්ණ පිළිබඳව හා යොදන අයුරුව පිළිබඳව සැලකිලිමත් විය යුතුය.




ද්‍රව්‍යයකින් අනෙක් ද්‍රව්‍යය මතුවන පරිද්දෙන් ද්‍රව්‍ය අතර අවකාශය රැකෙන පරිදි වර්ණ පූර්ණය කරන්න.

වර්ණ ශක්ති සකස් කරන්න. එමගින් සෑම ද්‍රව්‍යයකම පිහිටීම හා අනන්‍යතාව තීව්‍ර කර ගන්න.

ද්‍රව්‍ය සමූහයට ගැළපෙන පරිදි පසුබිම් සකස් කරන්න. මෙහිදී ද්‍රව්‍ය සමූහය ඉස්මතු වී සමස්තයක් ලෙස චිත්‍රයක් ගොඩ නැගෙන පරිදි පසුබිම යෙදිය යුතු අතර කිසිවිටෙකත් ද්‍රව්‍ය සමූහයෙන් පිටත දෘශ්‍ය වන දේ නොඅඳින්න.



ද්‍රව්‍ය කට්ටලයේ ඇති ද්‍රව්‍යයන් වර්ණ කිරීම අවසන් කර පසුබිම යෙදීම පිළිබඳව සිතනවාට වඩා පසුබිම පූරණයත් චිත්‍රය සමගම මූලික පූරණය වීම් සිදු වේ නම් වඩාත් උචිත ය. තවද දරුවන්ගේ චිත්‍ර ඇගයීමේ දී පසුතලයට ඉතා නොගැළපෙන තනි වර්ණයක් ද්විමානව යොදා ඇති අයුරු නිරීක්ෂණය වේ. එය ඔබට අවාසිදායක විය හැක. පසුබිම පූරණය සම්බන්ධව ඔබට යම් කිසි වැටහීමක් සඳහා මේ සමඟ ඇති ආදර්ශය ප්‍රයෝජනවත් විය හැක.


වැඩ අවසන් ද්‍රව්‍ය සම්පිණ්ඩන චිත්‍රය (පැස්ටල් මාධ්‍ය)

ජාතික මට්ටමේ විභාගවලදී ඔබට ලකුණු ලැබෙන්නේ කෙසේද?

1. රේඛා අධ්‍යයනය (ක්ෂණිකව රේඛාවෙන් කරන අධ්‍යයනය) ලකුණු 05
2. ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත්ව සංරචනය - ලකුණු 05
3. ද්‍රව්‍යයන්ගේ පරිමාණය හා ගති ස්වභාවයන් දැක්වීම- ලකුණු 05
4. සිද්ධාන්ත පිළිබඳ අවබෝධය (පර්යාවලෝකය, ඇස් මට්ටම, අවකාශ භාවිතය, ත්‍රිමාණ ලක්ෂණ) ලකුණු 05
5. වර්ණ මාධ්‍ය හැසිරවීම, උපක්‍රම, ශිල්ප ක්‍රම හා ගති ලක්ෂණ දැක්වීම - ලකුණු 05
6. උචිත පසුතල යෙදීම හා කෘතියේ සමස්ථ නිමාව - ලකුණු 05

**චිත්‍ර කලාව**

**පිළිතුරු පත්‍රය**

**I කොටස**

(1) පොළොන්නරු යුගයට

(2) නිශ්ශංකමල්ල රජතුමා

(3) බිනර මල

(4) සඳකඩ පහණ / මුරගල (පිළිතුරු දෙකම නිවැරදි ය.)

(5) ධ්‍යාන

(6) කටක හස්ත මුද්‍රාව

(7) ඉටිවාත්තු / පස් වාත්තු

(8) දොරවක ලෙන

(9) ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිලේ

(10) අවසාන භෝජන සංග්‍රහය

(11) iii (12) i (13) iv (14) ii (15) ii

(16) D (17) C (18) E (19) B (20) A

(21) චිත්‍රයක, මූර්තියක, කැටයමක මතුපිට ස්වභාවය වයනයයි.

(22) වම්පාදය මත දකුණු පාදය තබා ගෙන වාඩිගත් ඉරියව්ව

(23) මැටියෙන් කර පුළුස්සන ලද

(24) හින්දු කෝවිල්වල ඉහළට යන විට කුඩාවන කැටයම් මූර්ති වලින් පිරි වාස්තු විද්‍යාත්මක නිර්මාණය

(25) වෙස් මුහුණක් වර්ණ ගැන්වීමට ප්‍රථම මතුපිට මෘදු කර ගැනීමට යෙදූ ආලේපය

(26) ඇතන්ස් ගුරුකුලය, ඇතන්ස් පාසල

(28) ඩේවිඩ් පේන්ටර්

(29) ක්‍යුරොස්කියුරෝ, කියුරොක්කුරෝ

(30) සෝලියස් මැන්දිස්

(31) නායිකා

(32) තේරු, මකුද්ජම්, කෛලාස වාහනම්. සප්පරම් (මින් එක පිළිතුරක් යෙදීම ප්‍රමාණවත් ය.)

(33) අං සහිත දෙවියා

(34) ඩේවිඩ්

(35) නම් නොකළ

(36) මෙම රූපයෙන් දක්වෙන්නේ නටරාජ නම් වූ හින්දු මූර්තියයි.

(37) වෘත්තාකාර හැඩක් තුළ ශිව දෙවියන්ගේ නර්තන විලාශය සම්පිණ්ඩනය කර ඇත.

(38) ලෝහ වාත්තු ශිල්ප ක්‍රමය භාවිතා කර ලෝකඩ මාධ්‍යයෙන් නිම කර ඇත.

(39) ලෝකඩ වැනි මාධ්‍යයකට වඩාත් උචිත වන ලෙසින් හැඩතල ගොනුකර අපූරු නිර්මාණයක් ලෙස ඉදිරිපත් කිරීම උසස් ශිල්පීය ගුණයකි.

- අවස්ථාවේ ඇති උද්වේගකර බව රැකගනිමින් ප්‍රබල නඩත්ත නම් වූ නර්තන අවස්ථාව හොඳින් මූර්තිමත් කිරීම ශිල්පීය නිපුණතාවයි.

(40) සංකේත භාවිතයෙන්, මුද්‍රා භාවිතයෙන් ඊශ්වර දෙවියන්ගේ බලසම්පන්න බව හා විශ්වයේ පැවැත්ම හා විනාශය පෙන්වමින් කරන ලද මෙම මූර්තිය විශ්ව කලා නිමවුමකි.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සංවර්ධන අංශය

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත් ගෙදරටම ගෙන්වා ගන්න ඔන්ලයින් ඕඩර් කරන්න

www.store.pastpapers.wiki

වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA DISCOVER

NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers





LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440